# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2156/32 - 2020 ජනවාරි මස 03 වැනි සිකුරාදා - 2020.01.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : කඩු/ඉඩම්/03/135/යූඩීජ්.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ, මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තරය.*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 477 ඒ, තලංගම උතුර "බී" ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, තලංගම උතුර ගමේ (කඩුවෙල මහනගර සභා සීමාව තුළ) පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කර ඇති කො.9847 හා 2019.10.07 දින දරන මූලික පිඹුරෙහි කැබලි අංක 1 න් පෙන්නුම් කරන ප්‍රමාණයෙන් හෙක්.0.3717 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල:;

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: දොඹගහවත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: දිනේෂා පෙරේරා, කේ. ඒ. ආර්. ඩී. බී.විජේරත්න සහ තවත් අය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.3717.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020.01.29 වැනි දින පෙ.ව. 10.00 ට කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2020.01.22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශ්‍යතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය. හිමිකම් පෑමට සහාය වන සියලුම ඔප්පු හා වෙනත් ලියවිලි පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

ඒ. ඩී. වයි. ආනන්දනී,
ප්‍රාදේශීය ලේකම්,
කඩුවෙල.

2019 දෙසැම්බර් මස 31 වැනි දින,
කඩුවෙල, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී.

01-502

## ශුද්ධි පත්‍රිකාවයි

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වන පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : ඊපී/එල්ඩී/9/4/5.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 434/4 සහ 1986 දෙසැම්බර් මස 29 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රය* හා බැඳේ.

මහජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධිත) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :*

ගාල්ල දිස්ත්‍රික්කයේ, බෙ.ව.කො.(නැගෙනහිර) ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ අංක 26 ඇල්ල තණබද්දේගම ග්‍රාමසේවා වසමේ ඇල්ල තණබද්දේගම ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කළ අවසාන ගම් පිඹුරු 582 අතිරේක අංක 6 හි පෙන්වා ඇති පහත සඳහන් ඉඩම් කැබැල්ල:

01. **කැබලි අංක 470**

ඉඩමේ නම: යක්බටේකන්ද අද්දර හෙවත් ගහකොළදෙණිය; විස්තරය: අවු. 10 ක් වයස ඇති කොස් ගස් 03 ක්ද, උළු සෙවිලි කළ මැටියෙන් තැනූ තාවකාලික ගොඩනැගිල්ලක් සහ තාවකාලික ළිං දෙකක් ඇත; ප්‍රමාණය: අක්.02 රූඩ් 00 පර්.00.

ඉහත සඳහන් ඉඩමට අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020.02.18 වැනි දින පෙ.ව.10.00 ට ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2020.02.10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය. ඉඩම්වල තම අයිතිය තහවුරු කිරීම සඳහා අදාළ ඔප්පු හා වෙනත් ලිපිලේඛන පරීක්ෂණ දිනයේ දී රැගෙන ආ යුතු ය.

එස්. කේ. ඩබ්.සිසිර කුමාර,
ප්‍රාදේශීය ලේකම්,
ඇල්පිටිය.

2019 දෙසැම්බර් මස 31 වැනි දින,
ඇල්පිටිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01-503

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.